**පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 12දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවා සඳහා ගාස්තු ආදායම රු.70,440 කින් අඩුවෙන්ද විවිධ තැන්පතු ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි. | කාල පරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී අදාළ ගිණුමට මාරු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) | පූර්ව වර්ෂයේදී සිදු වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා රු.3,536,718 ක් ආදායම් ණයගැති ගිණුමට හර කර ආදායම් ගිණුම්වලට බැර කිරීමෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ආදායම් වැඩියෙන් දක්වා තිබුණි. | කාලච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරි අවසන් ගිණුම් සකස් කිරීමේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ආදායම් ණය ගැති ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (iii) | පූර්ව වර්ෂයේදී අතහැර තිබුණු රු.436,788 ක උපචිත වියදම් සමාලෝචිත වර්ෂයේදී වියදම් ගිණුමට සටහන් කිරීම නිසා වර්ෂයේ වියදම් රු.436,788 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිැවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | පූර්ව වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමේ ප්‍රවර්ථන වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් රු.1,982,058 කින් වැඩියෙන් දක්වා තිබුණි. | කාලච්ඡේදයට අදාළව ආදායම හඳුනා ගත යුතුවේ. | ඉදිරි අවසන් ගිණුම් සකස් කිරීමේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ප්‍රාග්ධන ආදායම් ගැති හිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.98,819,656 ක් වූ ගිණුම විෂයයන් 05 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | (සඳහන් කරන ලද වටිනාකම) පෙර වර්ෂයන්හි ලේඛන සොයා බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බවත්, කාරුණිකව දන්වමි. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා එහි උපලේඛන අතර රු.4,091,178 ක වෙනසක් විය. | තැන්පතු විස්තර හඳුනා ගැනීමට හෝ ඊට අදාළ සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතුවේ. | උප ලේඛනයන්ට අදාළ මෙම වටිනාකම් සඳහා අවශ්‍ය ලේඛන ඉතා පැරණි වර්ෂයන් සිට පැවත ඒම හේතුවෙන් එම ලේඛන සොයා ගැනීමේ පවතින දුෂ්කරතාවය මත ඒවා සම්බන්ධ උපලේඛන හා අවසන් ගිණුම් ශේෂ තුලනය කිරීමට මේ වන තෙක් අපොහොසත් වූ බව දන්වා සිටිමි. |

1.4 අනුකූල නොවීම්

නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.1,057,300 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි හිඟ මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සභාවට ඉදිරිපත් කර ඇති බවත්, අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත්, දන්වා සිටිමි. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව
------------------------------

| | | | |
|---|---|---|---|
| (i) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේ දී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට වර්ෂය ආරම්භයේ දී සමීක්ෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දුන් බවදන්වා සිටිමි |
| (ii) 218වැනි රීතිය | සියළුම ඉඩම් හා ගොඩනැගිලි, සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | වාහන හා මංමාවත් සම්බන්ධව වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදු කරනු ලබන බවත්, අනෙක් වත්කම් සම්බන්ධව වාර්ෂිකව නඩත්තු හා අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන බවත් දන්වා සිටිමි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේමුදල් රෙගුලාසි
------------------------------

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් සේවක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | ඇප මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ඇප තැබිය යුතු නිලධාරීන් සඳහා ඉදිරියේදී ඇප මුදල් තැම්පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දැනුම් දෙමි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | පූර්ව වර්ෂවලට අදාළ රු.4,565,419ක පොදු තැන්පතු හා කොන්ත්‍රාත්තැන්පතු රු.1,695,431 ක්සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම ඉකුත් වූ තැම්පතු ශේෂ සහා අරමුදලට මාරු කිරීමේ කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
-------------------------

### 2.1 මූල්‍යප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,088,926 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායමරු.11,185,706 ක් විය.

## 2.2 ආදායම්පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 600 | 658 | 569 | 130 | 1,147 | 1,321 | 1,233 | 57 |
| ජල බිල් | 7,500 | 7,082 | 6,434 | 647 | 7,000 | 7,343 | 7,078 | 116 |
| බලපත්‍ර ගාස්තු | 350 | 496 | 395 | 274 | 483 | 856 | 673 | 18 |
| | 8450 | 8236 | 7398 | 1051 | 8630 | 9520 | 8984 | 191 |

### 2.2.2 ජල බිල්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.557,303ක හිඟ ජලබිල් ආදායමක් විය. | සමාලෝචිත වර්ෂයේ හිඟ ජල බිල් ආදායම් අයකර ගත යුතුය. | ඉකුත් වර්ෂයට අදාළ වූ ජල බිල්පත් හිඟ ආදායම් මේ වන විට අය කරගෙන අවසන්ව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ රු.130,256 ක හිඟහිටි කුලී ආදායමක් අවසන් මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කළද කඩකුලීවලට අදාළ ලේඛන අනුව හිඟහිටි කඩකුලී රු.88,303 ක් විය. | කඩකුලී ලේඛණය නිවැරදිව යාවත්කාලීන කළ යුතුවේ. | මෙම හිඟ හිටි කඩ කුලී මුදල 2015 වර්ෂයේ සිට ඉදිරියට එන හිඟයක් බැවින් ඒ පිළිබඳව සමීක්ෂණය කර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස විෂය භාර නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වා සිටිමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ බලපත්‍ර ආදායම් රු.247,250 ක් වූ අතර ඉන් රු.149,550 ක්ඉකුත් වර්ෂවලට අදාල විය. | හිඟ බලපත්‍ර ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟ බලපත්‍ර ගාස්තුව 2018 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී වැරදීමකින් සටහන් වී ඇති ගාස්තුවකි. එය 2020 ගිණුම මඟින් නිවැරදි කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් අතුරු ව්යවස්ථා පනවාගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සැකසීමෙන් අනතුරුව ඒවා බලාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රධාන කාරණා 28ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ලිපි ලේඛන යවා ඇති නමුත් මේ වන තෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති බවත්, පිළිතුරු ලිපි ලැබුණු වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. |

(ආ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව කර නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) පරිසර බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාබල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පරිසල බලපත්‍ර අදාල වන ව්‍යාවසායන් සඳහා 2015 සිට 2019 දක්වා අයදුම්පත් 49 ක් නිකුක් කර තිබුණද ඊට අදාළව බලපත්‍ර 06 ක් පමණක් නිකුත් කර තිබුණි. | සමීක්ෂණයන් සිදු කර අදාළ කර්මාන්තයන් හඳුනාගෙන ෙපරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබුණද අදාළ නිර්ණායකයන් සම්පූර්ණ කර නොතිබීම නිසා පරිසර බලපත්‍ර 06 ක් පමණක් නිකුත් කර ඉතිරි ඒවා සඳහා බලපත්‍ර ලබා දීමක් කර නොමැත. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන නොතිබුණි. | කාලීනව තිරසර සංවර්ධනයට අදාළව නව අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය තිරසර සංවර්ධනයට අදාළව පවත්වා ගෙන යනු ලබන බවත්, තිරසර සංවර්ධනයට අදාළ අරමුණු, ඉලක්ක හා නිර්ණායකයන්ට අදාළව එකී ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු කරනු ලබන බවත් කාරුණිකව දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයට අදාළ උසාවි දඩ මුදල් ලබා ගැනීමට හා දේපළ පැවරීම මත අයකරන මුද්දර ගාස්තු ආදායම ලබා ගැනීම සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි. | වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් වාර්ෂිකව හඳුනා ගැනීමට හා ඒවා ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා සාකච්ඡා කර ඇති බවත්, ඉදිරියේ දී එම උසාවි දඩ මුදල් අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ලබන බවත්, දන්වා සිටිමි. |
| (ආ) | පූර්ව වර්ෂවල සිට පැවත එන රු.180,654 ක් වූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2013 වර්ෂයේ සිට පවතින මෙම ශේෂ ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබව බව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරු 07 ක පුරප්පාඩු 13 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව අදාල ආයතන දැනුවත් කර ලිපි යවා ඇති බව දන්වා සිටිමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන 03 ක් දීර්ඝ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | සුදුසු පරිදි අළුත්වැඩියා කර, භාවිතා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙහි දක්වා ඇතිමහින්ද්‍රා කැබ් රථය අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා සභා අනුමැතිය හිමි වී ඇති බවත්, අත් ට්‍රැක්ටරයක් 2018 භාණ්ඩ සමීක්ෂණය මඟින් අලෙවිකිරීමට අනුමැතිය ලබා දී ඇති බවත්, අනෙක් අත්ට්‍රැක්ටරය දැනට භාවිතා කළ හැකි මට්ටමේ පවතින බවත්, යකඩ බවුසරය අක්‍රියව ඇති බවත් දන්වමි. |

**3.5** **වාහන පරිපාලනය**

**------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | --------------- | --------------------- |
| (අ) | වාහන 13 ක දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මාසික සාරාංශ හා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | මාසික දෛනික ධාවන සටහන් ඉදිරියේ දී කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | සභාව භාවිතා කරන වාහන 06 ක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු තර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පවරා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. |